ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

## පහතරට ඇතැම් කුඩා තේ වගාවන් හි ආයු කාලය අඩුවීමට බලපා ඇති කරුණු

තේ වගාව හඳුන්වා දුන් මුල්ම යුගයේ සිටවූ බීජ තේ පැලවල ආර්ථික ආයු කාලය වසර 60-70 ට හෝ ඊට වැඩි කාලයක් වූ බව කියැවේ. බීජ තේ වගාවෙන් රිකිලි තේ වගාවට අප යොමුවූ අතර, රිකිලි තේ වගාවක ආර්ථික ආයු කාලය දිවයිනේ තේ වගා කරන විවිධ ප්‍රදේශ අනුව වසර 30-50 ක් වන බව ට අනුමාන කෙරිණි. අද වුවද පහතරට කලාපයේ ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතුවල වසර 30 කට ආසන්න ඵලදායි රිකිලි තේ වගාවන් පවතී. අංශයට සුවිශේෂ වූ යම් යම් ලක්ෂණ සැලකිල්ලට ගත්තද පහතරට ප්‍රදේශයේ කුඩා තේ වගාවක් වසර 20-25 ක් වත් පවත්වා ගත යුතු බවට අපේක්ෂා කිරීම අතිශයින් සාධාරණය. තත්වය එසේ වුවද, මෑත කාලීනව නැවත වගාවට යොමු කරන ලද සැලකිය යුතු කුඩා තේ ඉඩම් ප්‍රමාණයක්, එසේ යොමුව ඇත්තේ සිටුවා වසර 12-14 ක් ගතවීමෙන් පසුව බව පෙනී ගොස් ඇත. එහි තේරුම මෙම තේ වගාවල ආර්ථික ආයු කාලය වසර 12-14 කට පමණ අඩුවී ඇති බවය. පහතරට තේ වගාවේ වැඩි අස්වනු දෙන කාල සීමාවන් ලෙස සාමාන්‍ය පිළිගැනීම වන්නේ සිටුවා වසර 9-12 ත් අතර කාල සීමාවය. නමුත් දැන් සිදුවෙමින් පවතින ඛේදවාචකය, එනම් උපරිම අස්වැන්නක් ලැබිය යුතු කාල සීමාවක තේ වගාව ගලවා නැවත වගාවකට යාමට සිදුවීම බැරෑරුම්ව සිතා බැලිය



ආකාලයේ තේ පැළ මිය යෑම නිසා පාළුවූ ඉඩමක්

යුතුව ඇත. පහතරට විශාලවතු ආශ්‍රිතව සිදු කරන ලද අධ්‍යයනයකටද, අනුව, ඒවායේද ආර්ථික ආයු කාලයේ අඩුවීමක් පෙන්නුම් කරයි. මේ පිළිබඳව විධිමත් අධ්‍යයනයක අවශ්‍යතාවය මතුවන අතරම ඒ සඳහා බලපා හැකි කරුණු සැකෙවින් සාකච්ඡා කිරීම මෙම ලිපියේ අරමුණයි.

### (I) නිසි භූමි පරිහරණ රටාවක් නොමැතිවීම.

තේ වගාවට උචිත නොවන බිම් වල තේ වගා කිරීමට පෙලඹී ඇති අයුරු දක්නට ලැබේ. වතුර බැසයාම නිසිලෙස සිදු නොවන දෙනිය / ඔිව්ටි බිම් හා අඩු පාංශු ගැඹුරක් හා අධික බොරළු ඇති බිම් මෙහිදී කැපී පෙනේ. තේ වගාව වෙනුවට එවැනි භූමින්ට උචිත වගාවක් යෙදුවේ නම් ප්‍රථිඵල වඩාත් යහපත් වනු ඇත.

### (II). බිම් සැකසීම නිසි පරිදි සිදු නොකිරීම.

පරණ තේ වගාවක් ගලවා නැවත වගාවකට යාමට පෙර නිසි පරිදි බිම් සැකසීමක් කල යුතුය. තේ පඳුරු ගලවා භූමිය අඟල් 18` ගැඹුරට මුල්ලූ කර ගල්කැට හා පැන්සලකට වඩා ඝනකමක් ඇති මුල් ඉවත් කර ගල් වැටි හා කාණු වැනි උචිත පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කල යුතුය. එසේ වුවද ඇතැම් කුඩා තේ වතු හිමියන් එවැනි බිම් සැකැස්මක් සිදු නොකර ඍජුවම තේ වගා කිරීමට යොමු වනු දක්නට ලැබේ. මෙහි ඇති අවධානම නම් අළුත් වගාවේ මූල මණ්ඩලය පහසුවෙන් වර්ධනය වීමට නොහැකිවීමත් පස තුළ ඉතිරිවන මුල් ආශ්‍රිතව නව වගාවට ඇතැම් රෝග සම්ප්‍රේෂණය වීමේ අවධානම පැවතීමත්ය.



කඳ පිළිකා වලින් දුර්වල වූ වගාවක්

### (III) පාංශු පුනරුත්තාපනය නිසි පරිදි සිදු නොකිරීම.

පසේ භෞතික සරුභාවය වැඩිදියුණු කිරීමත්, පසේ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය වැඩිදියුණු කිරීමත්, පසේ නිරෝගිභාවය හා රෝග පළිබෝධ අවධානම අවම කිරීම වැනි අරමුණු ඇතිව තේ වගාවක් ස්ථාපිත කිරීමට පෙර තෘණ සිටුවා පාංශු පුනරුත්තාපනය කිරීම නිර්දේශ කෙරේ. එහෙත් ඇතැම් වගා කරුවන් වසර 11/2-2 පමණ වැයවන මෙම ක්‍රියා පිළිවෙළට අනුගත නොවී කෙටිකාලීන ප්‍රතිඵල අපේක්ෂාවෙන් පස පුනරුත්තාපනය නොකර ඍජුවම තේ වගා කරනු දක්නට ලැබේ. එහෙත් එවැනි ක්‍රමවල දිගු පැවැත්මක් නොමැති බව අවධාරනය කළ යුතුය.

### (IV) නිසි තවාන් පැල භාවිතා නොකිරීම

ඇතැම් වගා කරුවන් රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා කරන පැල නියමිත ප්‍රමිතියෙන් තොරය. ඒවා සමහරවිට බිම් පැල වන අතර නැතහොත් අඟල් 4 ක් පමණ මල්ලක රෝපිත දුර්වල පැළය. හොඳ තවාන් පැලයක් අවම වශයෙන් අඟල් 7 ක් උස බඳුනක රෝපිත කර තිබිය යුතු අතර අතු 2-3 ක් වත් බෙදී පත්‍ර 15 කින්වත් සමන්විත අඩියක් පමණ උසට වර්ධනය වී රෝග/පළිබෝධ හා ඌනතා ලක්ෂණ වලින් තොරව පැවතිය යුතුය. මෙලෙස නොවන තවාන් පැල ක්ෂේත්‍රයේ සිටවූ පසු ඇති වන කර්කශ තත්වයන්ට සාර්ථක ලෙස මුහුණ දීමට

ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ ප්‍රකාශනයකි

# තේ තතු

ISSN 1391 - 6785 වෙළුම 9 කාණ්ඩය 1 2012 ජුනි

නොහැකිව මිය යාම හෝ කඳ පිළිකා හෝ දිරා යාමේ තත්ත්වයට ලක්වීම හේතුවෙන් දුර්වල වන අතර එසේ වීම තුළ ඒවායේ ආයු කාලය අඩුවේ.

## (V) උචිත ප්‍රභේදයක් තෝරා නොගැනීම

ඇතැම් වගා කරුවන් නැවත වගා සඳහා තවමත් තෝරා ගනු ලබන්නේ TRI 2023 හා TRI 2026 වැනි ප්‍රභේදයන්ය. මින් TRI 2023 ප්‍රභේදය පහතරට සඳහා නිර්දේශයෙන් ඉවත් කර ඇත. මෙම ප්‍රභේද දෙකම අඩු වැඩි වශයෙන් කඳ පිළිකා, කඳ දිරා යාම මෙන්ම පහතරට සජීවී වේයාගේ ද හානියට ග්‍රාහිවේ. එමෙන්ම නියඟයටද ඔරොත්තු නොදේ. මුල් කාලයේදී වැඩි අස්වැන්නක් ලබා දී කෙටි කාලයක් තුළදී ඉහත තත්ත්වයන්ට ගොදුරු වී අකර්මන්‍ය වී යාම මෙම ප්‍රභේද දෙකේ සුලභ ලක්ෂණයකි. තේ පර්යේෂණ ආයතනය විසින් ඉහත තත්වයන් යටතේ වැඩි අස්වනු දෙන TRI 3000 හා 4000 කාණ්ඩයේ TRI 4042, TRI 4049,TRI 3055, TRI 3069 ඇතුළු ප්‍රභේද රැසක් හඳුන්වා දී ඇතත් ඒ පිළිබඳව මොවුන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර ඇති බවක් නොපෙනේ.

## (VI) නිසි ලෙස පැළ නොසිටුවීම හා ළපටි සහ තරුණ තේ වගා නිසි ලෙස නඩත්තු නොකිරීම.

පැළ සිටුවීමේදී අඟල් 18 ක් ගැඹුර ඇති පතුලේ විශ්කම්භය අඟල් 9 ක් වූද මතුපිට විශ්කම්භය අඟල් 12ක් වූද වළක් කැපීම නිර්දේශ කළද ඇතැමුන් උදැල්ලකින් යන්තමින් සාදාගත් වළක්



TRI 4042 ප්‍රභේදයට අයත් සාර්ථක වගාවක්

තුළ පැළ රෝපණය කරයි. මුල් කාලයේදී අවශ්‍ය නඩත්තුව නොකෙරෙන අතර නිසි සෙවනක් පවා නොලැබී යන අවස්ථා සුලබය. ළපටි කඳේ රාමුව හා මුල් වර්ධනය කර ගැනීමට උනන්දු නොවන අතර ඊට නිර්දේශිත පොහොර මිශ්‍රණ යෙදීමට වඩා, කුඩා පැළ අවධියේ සිටම දල්ලක් නෙලා ගැනීමට අවශ්‍ය වන පොහොර මිශ්‍රණ භාවිතා කිරීමත් බහුලව දක්නට ලැබේ. ඇතැම් වගා කරුවන් මුල් කප්පාදුව අවුරුදු 3 ක් වැනි ඉක්මන් කාල සීමාවකින් සිදු කරන අතර නොමේරූ තේ වගාව දිගු කාලීන වගාවකට සූදානම් කිරීමක් වෙනුවට පීඩාකාරී තත්වයන්ට ලක්වෙමින් වර්ධනය වේ. එම නිසා නොමේරූ අවධියේදී ඇතිවන එවැනි පීඩාකාරී තත්වයන් හේතුවෙන් මූල පද්ධතිය හා පඳුරේ සැකිල්ල නිසි ලෙස වර්ධනය නොවන අතර රෝග හා පළිබෝධයන්ට ඔරොත්තු දීමේ ශක්තිය ද හීන වී තේ පඳුරු විවිධ උපද්‍රවයන්ට පහසුවෙන් පාත්‍රවීමට පුලුවන. මේ හේතුව නිසා ලබාගත හැකි දළු ප්‍රමාණයද අඩුවේ.

## (VII) යහපත් කෘෂිකාර්මික පිළිවෙත් වලින් බැහැරවීම

පළමු කප්පාදුවෙන් පසු වුවද තේ වගාවට හොඳින් සාත්තු සප්පායම් කළ යුතුය. නිර්දේශිත යහපත් කෘෂිකාර්මික පිළිවෙත් තුලින් වගාව මනා ලෙස නඩත්තු කළ යුතුය.

මේ අවධියේදී මග හැරෙන ප්‍රධානතම යහපත් කෘෂිකාර්මික පිළිවෙතක් වන්නේ කප්පාදුව හා ඒ ආශ්‍රිත කෘෂිකාර්මික පිළිවෙත්ය. පහතරට ප්‍රදේශවල කප්පාදු චක්‍රයේ වැඩිම අස්වැන්නක් ලබා දෙන්නේ දෙවන වසරේ වන අතර 3 වසරේ අස්වැන්න තරමක් අඩුවේ. මෙය නොඉවසන ඇතැම් වගා කරුවන් නිර්දේශිත පරිදි වසර 3 ක් යාමට පෙර වසර 2 ක් 2 1/2 ට වරක් කප්පාදු කරයි. ළඟ ළඟ කප්පාදු සිදුවීම තේ ගසට පීඩාවක් වන අතර ඒ හේතුවෙන් සෑම කප්පාදුවකටම වරක් තේ පඳුරු රැසක් අහිමිවේ. තවද කප්පාදුවේදී දිරා ගිය කොටස්, රෝග/පළිබෝධ හානියට ලක්වූ කොටස් ශුද්ධ පවිත්‍ර කිරීම අවශ්‍ය වේ. බොහෝ දෙනෙකු මෙය නොතකා හරියි. අවසානයේ ඉහලින් ඇතිවන දිරා යාම් තේ පඳුරේ පහළ ප්‍රදේශ දක්වා වර්ධනය වී යළි ශුද්ධ කළ නොහැකි තත්වයට පත්වේ. එමෙන්ම කප්පාදුව හා බැඳුණු තවත් කෘෂිකාර්මික පිළිවෙත් (කප්පාදුවට පෙර දළුනොකඩා පඳුරු විවේක ගැන්වීම, රාමුවේ පෙඳ පාසි ඉවත්කිරීම, මුල්ලු ගැහීම, ප්‍රමාණවත් කොළ තට්ටුවක් ඉතිරිකර මට්ටම් කැපීම පසේ පී. එච්. අගය පරීක්ෂාකර බලා ඒ අනුව ඩොලමයිට් යෙදීම, පාලු පැළ සිටුවීම) රැසක් පවතින අතර ඒවා නොතකා හරින අවස්ථාද බොහොමයක් හමුවේ. මීට අමතරව නිර්දේශිත පොහොර මිශ්‍රණ භාවිතා නොකිරීමත්, අධික පොහොර ප්‍රමාණයන් වැඩිවාර ගනනක් භාවිතා කිරීමත් බහුලව දක්නට ලැබෙන තේ වගාවේ දිගුකාලීන පැවැත්මකට අහිතකර පිළිවෙත්ය.

දෙවන කප්පාදු චක්‍රයෙන් පසු වසර 12 ක් පමණ යනතුරු සෑම කප්පාදුවකටම පසු පාලු පැළ සිටුවීමක් කලයුතු නමුත් එවැන්නක් සිදු නොවේ. මේ හේතුවෙන් වසර 14 ක් ගතවීමත් සමග අස්වැන්නේ ශීඝ්‍ර අඩුවීමක් පෙන්නුම් කරයි.

මේ අනුව ඉහතින් දක්වා ඇති අහිතකර පිළිවෙත් එකක් හෝ කිහිපයක් ඔබ අතින් සිදුවන්නේ නම් ඔබගේ තේ වගාවේ ආයු කාලයත්, ලබාගත හැකි අස්වැන්නත්, උපරිම අස්වැන්න ලබා ගත හැකි කාල සීමාවත් අඩුවිය හැකි බව කිව හැකිය.

එසේ නොමැතිව මෙහි දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන තේ වගාවක් ආරම්භකර හොඳින් පවත්වාගෙන යන්නේ නම් සාර්ථක හා දිගුකාලීන තේ වගාවක සාඩම්බර හිමිකරුවකු වීමට ඔබට ද හැකිවනවා ඇත.

ජානක මහින්දපාල